# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2034/23 – 2017 අගෝස්තු 30 වැනි බදාදා – 2017.08.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දකුණු ගිරුවාපත්තුව සුළු කොට්ඨාසයේ, කඳුරුපොකුණ (අ.ග.පි. 311) ගමේ පිහිටි, හම්බන්තොට දිස්ත්‍රික් මිනින්දෝරු අධිකාරී විසින් පිළියෙල කරන ලද අංක එච්/ටීඑන්ජ්/2012/406 හා 2012.10.24 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0386 ක් පමණ වූ පහත සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – මුගුණගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0386

උතුරට: මාර්ගය සහ අබේසිංහගේ පුෂ්පා ප්‍රියංගනී පදිංචි මුගුණගහවත්ත; නැගෙනහිරට: අබේසිංහගේ පුෂ්පා ප්‍රියංගනී පදිංචි මුගුණගහවත්ත සහ කේ. ඩබ්. ඒ. දොන් සියදෝරිස් පදිංචි මුගුණගහවත්ත; දකුණට: කේ. ඩබ්. ඒ. දොන් සියදෝරිස් පදිංචි මුගුණගහවත්ත සහ මාර්ගය; බටහිරට: මාර්ගය.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: එල්ඩී/05/2009/පීසී/196.
2017 ජූලි මස 05 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

09 – 333

1A – G26181 – 17 (2017/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*